DOI : 10.31357/fhssmst.2009.00664

# පොලිසිය විසින් පුද්ගලයින් කෲර වධ හිංසාවලට භාජන කිරීම පිළිබඳව අපරාධ විද්‍යාත්මක අධ්‍යනයක්

ගාමිණී දිසානායක

ශාස්ත්‍රපති උපාධිය

2009

# පොලිසිය විසින් පුද්ගලයන් කෲර වධ හිංසාවලට භාජන කිරීම
# පිළිබඳව අපරාධ විද්‍යාත්මක අධ්‍යනයක්

සම්පූර්ණ නම : ගාමිණී දිසානායක

ලියාපදිංචි අංකය :GS/SS/2300/2004

වර්ෂය : 2004/2005

අපරාධ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධනය.

සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයන අංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,
ගංගොඩවිල,
නුගේගොඩ.

**පර්යේෂකගේ සටහන**

මෙම ශාස්ත්‍රීය නිබන්ධය සමාජ
විද්‍යා හා මානව
අධ්‍යයනාංශයේ
අධ්‍යනාංශ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ
කථිකාචාර්ය එච්.ඩබ්.
ජයසුන්දර
මහතා හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ඩබ්.එම්. ධනපාල
යන
මහත්වරුන්ගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද
බවත්, මේ පර්යේෂණය කොටස්
වශයෙන් හෝ සම්පූර්ණ
වශයෙන්
හෝ වෙනත් විශ්ව
විද්‍යාලයකට හෝ
ආයතනයකට හෝ වෙනත්
උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද
බවත්. සහතික කරමි.

..............................

පර්යේෂක.

## උපදේශකවරුන්ගේ සටහන

පොලිසිය විසින් පුද්ගලයින් කෲර වධ හිංසා වලට භාජනය කිරීම පිළිබඳව අපරාධ විද්‍යාත්මක අධ්‍යයනක් නැමැති මෙම පර්යේෂණ නිබන්ධය අපගේ උපදේශකත්වය යටතේ සම්පාදනය කරන ලද බවත්, පර්යේෂක විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මෙම නිබන්ධය ඇගයීම් කාර්යය සඳහා විශ්ව විද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමු.

එම්.ඩබ්. ජයසුන්දර
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

ඩබ්.එම්. ධනපාල
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

එම්.ඩබ්. ජයසුන්දර
අධ්‍යයනාංශ ප්‍රධාන
සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
නුගේගොඩ

This is to certify that Mr. Gamini Dissanayaka has done all the Corrections, additions & amendments in ~~the~~ accordance with the Comments & Suggestions of the examiners.

09/12/2009

09/12/09.

2009/12/09

උපකාරක සැමරුම්

- අපරාධ විද්‍යාව නැමැති විෂයය පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා මා උනන්දු කළ මහාචාර්ය නන්දසේන රත්නපාලන මැතිදුන්ට
- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා මානව විද්‍යා හා අපරාධ විද්‍යා අධ්‍යන අංශයේ ආචාර්ය ප්‍රනීත් අබේසුන්දර මැතිදුන්ට,
- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා මානව විද්‍යා හා අපරාධ විද්‍යා අධ්‍යන අංශයේ අංශ ප්‍රධානී මැතිදුන්ට,
- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා, මානව විද්‍යා, අපරාධ විද්‍යා අධ්‍යන අංශයේ ආචාර්ය මණ්ඩලයේ සියලුම මහත්ම මහත්මීන්ට,
- මාගේ පර්යේෂණයේ අඩු පාඩු නිවැරදිව සොයා බලා සෑම අයුරකින්ම උපදෙස් දීමා දිරිමත් කළ මාගේ උපදේශකවරුන් වන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එම්.ඩබ්.ජයසුන්දර මහතා හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඩබ්.එච්. ධනපාල මහතාට ද,
- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යන අංශයේ පීඨාධිපති තුමිය ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයට,
- ගරු පොලිස්පති තුමාට,
- ශ්‍රී ලංකා පොලිසියේ සියලුම සහෝදර නිලධාරි මහතුන්ට,
- ශ්‍රේෂ්ඨාධිකරණයේ ගරු විනිසුරුවරුන්ට හා කාර්ය මණ්ඩලයේ නිලධාරින්ට,
- නීතිපති දෙපාර්තමේන්තුවේ ගරු නීතිපතිතුමාට හා සියලුම නිලධාරින්ට,
- පරිගණක කටයුතුවලදී මට සහය දුන් කා.පො.කො. දූර්ගිකා සිරිවර්ධන මෙනවිය හා කා.පො.සැ. ඊ.පි. පත්මලතා මිය හා උ.පො.ප. ජේ.සී. වීරතුංග හා කා.පො.කො. ගයනි බුදාගොඩ, හා පො.කො. කේ.පී තුෂාර, හා පො.කො. ප්‍රේමසිරි යන නිලධාරින්ට,
- මට නිරතුරුව සහය වු මගේ බිරිඳ ශිරානි හා දියණියන් වන අශිකා හා ෂලින්දි යන දෙදෙනාට,
- නන් අයුරින් සහය දුන් සියලු දෙනාට,

හද පිරි බැතින් යුතුව ගෞරවාදර ස්තුතිය පුද කරමි.

## සංක්ෂිප්තය

මෙම පර්යේෂණය පොලිසිය විසින් පුද්ගලයන් කෲර වධ හිංසාවලට භාජන කරනු ලැබීම පිළිබඳ අපරාධ විද්‍යාමක අධ්‍යයනයක් ලෙසට නම් කර ඇත. මෙම පර්යේෂණයේ අරමුණ වනුයේ මෑත කාලීනව බොහෝ රට වැසියන්ගේ අවධානයට ලක් වී ඇති මතෘකාවන් වන පොලිස් අත්අඩංගුවේ සිටින පුද්ගලයින්ට පොලිසිය විසින් වධ හිංසා පමුණුවන බවට එල්ල කරනු ලබන චෝදනාව පිළිබඳ අපරාධ විද්‍යාත්මක විමසා බැලීම වේ.

මෙම පර්යේෂණයේ දි යොදා ගනු ලබු ප්‍රධාන ක්‍රමවේදය ලෙසට හඳුන්වා දිය හැක්කේ ලිඛිත මූලාශ්‍ර හා ක්ෂෙත්‍ර මූලාශ යෙදා ගනිමින් තොරතුරු රැස් කිරිම වේ. ප්‍රධාන වශයෙන් ලිඛිත මූලාශ්‍ර ලෙස නඩු වාර්තා , පොලිස් වාර්තා, වෛද්‍ය වාර්තා ආදි මූලාශ්‍ර හා මෙම විෂය සම්බන්ධයෙන් ලියැවි ඇති පොත් පත් හා සඟරා ආදිය උපයෝගි කර ගන්නා ලදි. ක්ෂෙත්‍ර පරික්ෂණවලදි යෙදා ගනු ලැබු මූලාශ්‍ර ලෙසට පොලිස් නිළධාරින්ගේ නඩු විසඳනු ලැබු විනිසුරුවරුන්, මෙවැනි නඩු සඳහා පෙනි සිටින නීතිඥයින් හා වින්දිතයන් සමඟ සම්මුඛ සාකච්ජා සිදු කරන ලදි. ඊට අමතරව මූලික අයිතිවාසිකම් පිළිබඳ ක්‍රියාත්මක වන විවිධ රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයින්, වරදකරුවන්, වෛද්‍යවරුන් හා වෙනත් රාජ්‍ය සංවිධාන වල නියෝජිතයින් සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ජා තුලින් තොරතුරු රැස් කරන ලදි. තවද, මෙවැනි සිද්ධිවලදි තුවාල ලැබු බව කියන තුවාලකරුවන් හා එම වධ හිංසා පැමිණවිම සිදු කරනු ලැබු ස්ථාන හා ඒ සඳහා උපයෝගි කරනු ලැබු බව කියන උපකරණ ආදිය පරික්‍ෂා කිරිම් ද සිදු කරන ලදි.

මෙම පර්යේෂණයේ දි මූලිකව සොයා ගනු ලැබු තොරතුරු ලෙසට දැක්විය හැක්කේ මෙවැනි පහර දිම හා වධ හිංසා සිදු කිරිම් පොලිස් අත් අඩංගුවේ දි සිදු වන බවය. එසේම පොලිස් නිළධාරින් තම රාජකාරි කටයුතු ඉටු කිරීමේ දී ආකාරයේ සිද්ධින් පිළිබඳව පොලිසියෙන් වාර්තා වන බවය. අපරාධ විමර්ෂණ කටයුතු හෝ ත්‍රස්තවාදි විමර්ෂණ කටයුතු සිදු කිරිමේ දි මෙවැනි චෝදනා මූලිකව එල්ල වන බව දැක්විය හැක. මෙවැනි බොහෝ සිදුවිම් සිදුවි ඇත්තේ අපරාධවලට සම්බන්ධ සැකකරුවන්ගෙන් සොරකම් කරන ලද දේපළ සොයා ගැනිමට යාමේ දි හෝ ත්‍රස්තවාදි ක්‍රියාවන්ට සම්බන්ධ සැකකරුවන්ගේන් පාපෝච්චාරණ ලබා ගැනිමට දරණු ලබන උත්සාහයේ දි බවට කරුණු අනාවරනය වී ඇත. එසේම පොලිස් නිලධාරින් සිදු කරනු ලබන මෙවැනි පහර දිම් හා වධ හිංසා පැමිණවිම් පොලිස් සංස්කෘතිය තුල පවත්වාගෙන එනු

ලබන ක්‍රියාවලියක් ලෙසට දැක්විය නොහැක. මෙය බොහෝවිට අපරාධ විමර්ෂණයේ යෙදි සිටින පොලිස් නිළධාරියාගෙන් පොලිස් නිලධාරියාට වෙනස්වන අතර මෙම නිළධාරින්ගේ පුද්ගලික චර්යාව හා ඔවුන්ට ආවේණිකව පවතින්නක් බව පෙනී යන ලදී. වධ හිංසා පැමිණවීම සිදු කරනු ලබන නිළධාරීන් ඔවුන්ගේ කැමැත්ත මත ගන්නා තීරණ අනුව මෙවැනි ක්‍රියා සිදු කරන බව පෙනී යන ලදී.

සමස්ථ පොලිස් සේවය තුල වධ හිංසා පැමිණවිම එකම ආකාරයකින්, එකම ක්‍රමවේදයක් අනුව පවත්වාගෙන යනු ලබන්නක් නොවන බවද,එය අදාල පොලිස් ස්ථාන පාලනය කරනු ලබන ස්ථානාධිපතිවරුන්ගේ පරිපාලන හා එම පොලිස් ස්ථාන අධීක්‍ෂණය කරනු ලබන සහකාර පොලිස් අධිකාරිවරුන්ගේ පරිපාලනයේ දුර්වල තාවයන් මත රදා පවතින බව පැහැදිලිව සොයා ගනු ලැබිය. ඉතා දක්‍ෂ ක්‍රියාශිලි ස්ථානාධිපතිවරුන් හා කාර්යක්‍ෂම සහකාර පොලිස් අධිකාරිවරුන් සේවය කරනු ලබන පොලිස් බල ප්‍රදේශවල පොලිස් නිළධාරින් මෙවැනි ක්‍රියාවන්ට පෙළඹීමට මැලිකමක් හා භයක් දක්වයි. නමුත් පරිපාලනය දුර්වල ස්ථානාධිපතිවරුන් සිටින පොලිස් ස්ථානවලින් බොහෝ විට පහරදිම හා වධ හිංසා පැමිණ වීම් වාර්තා වන බව අනාවරණය කර ගන්නා ලදි. අවසාන වශයෙන් මෙම පරියේෂණයේදි පැමිණි නිගමනය වනුයේ පොලිස් සේවය තුල ඇති වධ හිංසා පැමිණ විම සමස්ත පොලිස් සේවය තුලම එකම ආකාරයකින් ක්‍රියාත්මක නොවන බවය. එය බෙහෝ විට අපරාධ විසඳීමේ දී නීතිය පිලිබඳ මනා දැනිමකින් තොරව ක්‍රියා කරනු ලබන නිළධාරින් විසින් යොදා ගනු ලබන ක්‍රමවේදයන් නිසා සිදු වන්නක් බවය. මෙය දැනට පොලිසිය තුල ක්‍රමයෙන් අඩුවෙමින් පවතින බව පැහැදිලිව නිරීක්‍ෂණය කරන ලදි.

බොහෝ පොලිස් නිළධාරින් මෙම වධ හිංසා පැමිණීම් කිසියම් පෞද්ගලිකමය ලාභ ප්‍රයෝජන ලබා ගැනීමේ චේතනාවකින් යුක්තව සිදු කරනු ලබන ක්‍රියාවලියක් නොවන බවද, බොහෝ විට අපරාධ විසඳිම මගින් මහජන පැමිණිලිවලට සාධාරණය ඉටු කිරීමේ චේතනාවකින් සිදු කරනු ලබන ක්‍රියාවක් බව පෙනී යන ලදි. නමුත් අපරාධ විමර්ෂණය සිදු කිරිමේ දි මහජනතාවගේ මූලික අයිතිවාසිකම් ආරක්‍ෂා වන ආකාරයේන් එම කටයුතු නීතියෙන් ලබා දී ඇති බලතල තුල

අදාල විමර්ෂණ සිදු කිරීමට නිළධාරීන් පෙළඹවන ආකාරයෙන් පහසුකම් හා දැනුම ලබාදීම තුලින් පොලිස් දෙපාර්තමේන්තුව හා රජය මෙවැනි ආකාරයේ චෝදනාවලට ලක් වීම වළක්වාගත හැකිය.

# පොලිසිය විසින් පුද්ගලයන් කෲර වධ හිංසා වලට භාජන කිරීම පිළිබඳව අපරාධ විද්‍යාත්මක අධ්‍යයනයක්

## 1. පලමුවන පරිච්ඡේදය - හැඳින්වීම හා පසුබිම


| | | | |
|---|---|---|---|
| 1.1 | මාතෘකාව | | 01 |
| 1.2 | පර්යේෂණ ගැටලුව | | 02 |
| 1.3 | පරමාර්ථය | | 03 |
| 1.4 | ක්‍රමවේදය | | 03 |
| | 1.4.1 | මූලාශ්‍ර | 03 |
| | 1.4.2 | ක්ෂෙත්‍ර මූලාශ්‍ර | 04 |
| 1.5 | දත්ත රැස් කිරීම | | 04 |
| 1.6 | දත්ත විශ්ලේෂණය | | 05 |
| 1.7 | පර්යේෂණයේ සීමාවන් | | 06 |


## 2. දෙවන පරිච්ඡේදය - සැකකරුවන්ට වධ හිංසා පැමිණවීම වැළැක්වීමට පවතින නීති රීති


| | | | |
|---|---|---|---|
| 2. | හැඳින්වීම | | 07 |
| 2.1 | වධ හිංසා නිර්වචනය | | 07 |
| 2.2 | වධ හිංසා පැමිණවීම පිළිබඳ ඉතිහාසය | | 08 |
| 2.3 | වධ හිංසා වර්ග | | 11 |
| | 2.3.1 | ශාරීරික වධ හිංසා | 12 |
| | 2.3.2 | මනෝ විද්‍යාත්මක වධ හිංසා | 12 |
| | 2.3.3 | මානසික වධ හිංසා | 13 |
| | 2.3.4 | ඖෂධ භාවිතය මගින් කරනු ලබන වධ හිංසා | 13 |
| | 2.3.5 | කාම වධ හිංසා | 14 |
| 2.4 | වධ හිංසා පැමිණවීමට භාවිතා කරන ක්‍රමවේද | | 14 |
| 2.5. | මානසික වධ හිංසා සිදු කිරීමට යොදා ගන්නා ක්‍රම | | 16 |

2.5.1 රසායනික ද්‍රව්‍ය හෝ ඖෂධ භාවිතා කිරිම 16

2.5.2 පුද්ගලයෙකු වෙනුවට වෙනත් පුද්ගලයෙකුට වධ හිංසා සිදු කිරිම 17

2.6 වධ හිංසා පැමිණවීම හා සම්බන්ධ දර්ශනය 18

2.7 වධ හිංසා සිදු කිරිමට පෙළඹවීමේ හේතු 20

2.8. වධ හිංසා පැමිණවීමේ බලපෑම් 21

2.9. වර්තමානයේ වධ හිංසා පැමිණවීම් 22

2.10 වධ හිංසා වලට එරෙහිව පවතින ජාත්‍යන්තර නීති 24

2.10.1 මානව හිමිකම් විශ්ව ප්‍රකාශය 25

2.10.2 කෲර වධ හිංසා වලට එරෙහි සම්මුතිය 27

2.10.3 මානව හිමිකම් යුරෝපිය සම්මුතිය 30

2.10.4 වධ හිංසා වලට හා අවමන් සහගත සැළකිලි වලට එරෙහි වූ සම්මුති පනත 32

2.10.5 ස්ථාන්බුල් ගිවිසුම 34

2.10.6 නීතිය ක්‍රියාත්මක කරන නිලධාරින්ගේ ආචාර ධර්ම 35

2.10.7 වෙනත් ජාත්‍යන්තර ගිවිසුම් 35

2.11 වධ හිංසා වලට එරෙහිව ලංකාවේ පවතින නීති 37

2.11.1 1994. අංක 22 දරණ පනත 39

2.11.2 ලංකාවේ භාවිතා වන වෙනත් නීති 41

2.12 වධ දීම පිළිබඳ ශ්‍රී ලංකාවේ නඩු නීතිය 42

2.13 පොලිස් වධ හිංසා පැමිණවීම 51

**3. තුන්වන පරිච්ඡේදය - නඩු වලින් හෙලිවන පොලිස් වධ හිංසා**

3.1 වධ හිංසා කිරිම්වල බලපෑම් 61

3.2 පොලිසියට විරුද්ධව ඇති වධ හිංසා කිරිම් පිළිබඳ වාර්තා 65

3.3. පොලිස් වධ හිංසාවල ස්වභාවය 69

3.4 සිද්ධි අධ්‍යයන I 76

3.4.1 සිද්ධි අධ්‍යයන II 90

**4. හතරවන පරිච්ඡේදය -**

4 දත්ත විශ්ලේෂණය 103

**5. පස්වන පරිච්ඡේදය -**

5 නිගමන හා යෝජනා 123

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 126

උප ලේඛණය. 134

## පලමුවන පරිච්ඡේදය

### හැඳින්වීම හා පසුබිම

### 1:1 මාතෘකාව

මෙම මාතෘකාව යටතේ සිදු කිරිමට බලාපොරොත්තු වන පර්යේෂණය වන්නේ පොලිසිය විසින් පුද්ගලයන් කෲර වධ හිංසා වලට භාජන කිරිම සම්බන්ධයෙනි. ඇත්ත වශයෙන්ම ජන මධ්‍යය හා රාජ්‍ය නොවන මානව හිමිකම් සංවිධාන චෝදනා කරන ආකාරයේ වධ හිංසා හා පහරදිම් පොලිසිය තුල සිදු වනවාදැයි පොලිස් සංස්කෘතිය තුළ වධ හිංසා පැමිණවීම කාලාන්තරයක් මුළුල්ලේ පැවත එන්නක්ද, එසේ නොමැති නම් මෙම ක්‍රියාවලිය එක් එක් පොලිස් නිළධාරින්ගේ පෞද්ගලිකත්වය මත සිදු කරනු ලබන ක්‍රියාවක්ද ? මෙවැනි වධ හිංසා හා පහර දීම් සිදු කරනු ලබන්නේ කුමන අරමුණක් සඳහා ද? යන්න පිළිබඳව මෙම මාතෘකාව යටතේ විමර්ෂණය කිරිමට කටයුතු කරන ලදී. එසේම පොලිස් විමර්ෂණ වලදී පොලිස් නිළධාරින් වධ හිංසා කිරිම් හා පහර දීමේ ක්‍රම භාවිත කිරිමට පෙළඹෙන හේතුන් පිළිබදව සොයා බැලීමට කටයුතු කරන ලදී.

පොලිසිය සිදු කරන වධ හිංසා කුමන අකාරයේ වධ හිංසාද, එය සිදු කරනු ලබන්නේ කුමන පසුබිමක් තුලද එසේ කිරිම මගින් පොලිස් නිළධාරින් බලාපොරොත්තු වන්නේ කුමක්දැයි යන්න මෙම පරීක්‍ෂණයේදී විමර්ෂණය කරන ලදී. මෙවැනි මාතෘකාවක් පරීක්‍ෂණ මාතෘකාව ලෙස තෝරා ගනු ලැබුවේ එය කාලීන මාතෘකාවක් වු බැවින්ද, අද නූතන ලෝකයේ මානව හිමිකම් පිළිබඳ පිබිදීමක් ඇති වෙමින් පවතින යුගයක දියුණු වෙමින් පවතින රටක් වන

ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයක් වන පොලිසිය වෙත මෙවැනි චෝදනා එල්ල වීම නිසා ශ්‍රී ලංකාව අන්තර් ජාතික වශයෙන් අපහසුවට ලක් වන අතර දියුණු වෙමින් පවතින රටවලට ලැබෙන ආධාර ශ්‍රී ලංකාව වෙත ලබා ගැනීමේ දි ශ්‍රී ලංකා රාජ්‍යයට නොයෙක් අපහසුතාවයන්ට මුහුණ දීමට සිදු වී ඇත.

1.2 පර්යේෂණ ගැටලුව

පොලිසිය විසින් සැකකරුවන්ට වධ හිංසා පමුණුවන ලබන බවට හා ඒ මගින් අපරාධ විමර්ෂණ කටයුතු සිදු කරන බවට බලවත් චෝදනාවක් කාලයක සිට පවතින අතර, විවිධ අවස්ථා වලදී මෙවැනි සිද්ධී අධිකරණයේදී තහවුරු කරනු ලැබ තිබේ. මෙවැනි තහවුරු කිරීම් ශ්‍රී ලංකාව තුල පමණක් නොව අන්තර් ජාතික අධිකරණ වල පවා පිළිගෙන ඇත. (සිංගරාසා නඩුව ජිනිවා මානව හිමිකම් කොමිෂන් සභාවේ ගොනු කරනු ලැබූ අංක 1033 /2000 දරණ නඩුවේ තින්දුව අනුව)

වධ හිංසා පැමිණවීම නීති විරෝධි කටයුක්තක් වුවත්, නෛතික ආයතනයක් තුල එනම් නීතිය ක්‍රියාත්මක කිරිම හා මහජන ආරක්‍ෂාව සම්බන්ධයෙන් ප්‍රධාන වගකීම දරණ පොලිසි තුල මෙවැනි නීති විරෝධි කටයුත්තක් පවතින්නේ නම් එය බරපතල කටයුත්තක් වන්නේය. දිගින් දිගටම එවැනි චෝදනාවක් එල්ලවීමත්, වරින් වර මානව හිමිකම් නීතිය යටතේ මෙවැනි සිද්ධි සනාථ වීමත් මගින් පරීක්‍ෂණ ගැටළුවක් මතු කරන්නේය. එබැවින් මෙම පර්යේෂණ ගැටලු මගින් නෛතික ආයතනයක් වන පොලිසිය තුල වධහිංසා පැමිණ වීම කවර හේතුවක් නිසා පවතින්නේද? යන්න හා එය කවර ස්වභාවයකින් කවර මට්ටමේ බලපෑමක් හා ව්‍යාප්තියකින් යුතුව පවතින්නේද ? යන්න පර්යේෂණාත්මකව විමර්ෂණයට ලක් කරනු ලැබීය. වධ හිංසා පැමිණවීම යනුවෙන් අදහස් කරනු ලබන්නේ කවර සණයේ චර්යාවක්ද යන්නත්, එම වධහිංසා පොලිසියේ රාජකාරි ඉටු කිරිම විෂයේ කිසියම් කාර්යක්‍ෂම වැදගත්කමක් සහිත උපාය මාර්ග ක්‍රමයක් වි තිබේ ද යන්නත් විමර්ෂණය කළ යුතු කරුණක් වන්නේය.

කලාන්තරයක් තිස්සේ ගෙඩනැගුණු පොලිස් සංස්කෘතිය තුල වධ හිංසා පැමිණ විම කිසියම් පිලිගත් උපාය මාර්ගයක් ලෙස අනුමත වි, ස්ථාපනයවී දිගින් දිගටම පවතින්නේ ද යන්න හා එය එවැනි සංස්කෘතික ස්ථාපනයකින් හෝ පොලිස් අධ්‍යාපනයකින් හෝ පොලිස් අත්දැකීම්වලින් හෝ ලැබෙනවාට වඩා ඒ ඒ පොලිස් නිළධාරින් ගේ අවස්ථාමය හිතුවක්කාරි පෞද්ගලික ක්‍රියාවන් හේතුවෙන් ඇතිවන්නේ යන වග මෙහිදි ගවේශනය කළ යුතු ගැටළුවකි.

1:3 පරමාර්ථය

මෙම පර්යේෂණයේ මූලික පරමාර්ථ ලෙස පහත දැක්වෙන පරමාර්ථයන් කැටි කොට දැක්විය හැකිය.

(අ) අත්අඩංගුවේ සිටින සැකකරුවන්ට සැලකිමට අදාළව පවතින නෛතික ප්‍රතිපාදන හා අන්තර් ජාතික ප්‍රඥප්ති හඳුනා ගැනිම.

(ආ) "වධ හිංසාව" යන සංකල්පයට අන්තර් ජාතික වශයෙන් දි ඇති අර්ථ කථනය හා එම අර්ථ කථනය ශ්‍රී ලංකාව ආශ්‍රයෙන් හඳුනා ගැනිම.

(ඇ) වධ හිංසා පැමිණ විම කෙරෙහි බලපා ඇති හේතු සාධක හඳුනා ගැනිම.

(ඈ) වධ හිංසා පැමිණ විම් සිදු කරන ආකාරය පිළිබඳ තොරතුරු රැස් කිරිම.

(ඉ) පොලිසිය විසින් සිදු කරනු ලබන වධ හිංසා හඳුනා ගැනිම.

(ඊ) වධ හිංසාවල ප්‍රතිවිපාක විමර්ෂණය කිරිම.

(ඔ) පොලිස් ක්‍රියාකාරිත්වය හා වධ හිංසා පැමිණ විම අතර සම්බන්ධය අනාවරණය කිරිම.

1:4 ක්‍රමවේදය

1:4:1 මුලාශ්‍ර

මෙම තොරතුරු රැස් කිරිමේ දි ප්‍රධාන මුලාශ්‍ර දෙකකින් තොරතුරු රැස්කිරිම් සිදු කරන ලදි. එනම් ලිඛිත මුලාශ්‍ර හා ක්‍ෂේත්‍ර මුලාශ්‍ර යන ක්‍රමවේදයන් පරික්‍ෂණයේ දි මුලික වශයෙන් උපයෝගි කර ගන්නා ලදි.

ලිඛිත මුලාශ්‍ර වශයෙන් ප්‍රධාන ලෙසට උපයෝගි කර ගනු ලැබුවේ, මුලික අයිතිවාසිකම් කඩ කිරිම් වශයෙන් පවරා තිබු නඩුවල නඩු වාර්තා වන අතර ඊට අමතරව පොලිස් වාර්තා, වෛද්‍ය වාර්තා, මෙවැනි වධ හිංසා පැමිණ විම සම්බධයෙන් කරුණු පල කරමින් රාජ්‍ය නොවන සංවිධාන පළ කරනු ලැබු වාර්තා, ලිපි හා සඟරා ආදිය වේ.

වධ හිංසා පැමිණ වීම සම්බන්ධයෙන් තුවාලකරුවන් හා වින්දිතයින් පරීක්ෂා කරනු ලැබූ වෛද්‍යවරුන් විසින් ප්‍රකාශයට පත් කරන ලද සම්මන්ත්‍රණ පත්‍රිකා, ලේඛන හා ලිපි ඇසුරු කර ගෙන ලිඛිත මූලාශ්‍රවලින් කරුණු රැස් කරන ලදි.

## 1:4:2 ක්ෂේත්‍ර මූලාශ්‍ර

ක්ෂේත්‍ර මූලාශ්‍ර ලෙසට පොලිස් නිළධාරින් සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡා, නඩු විසඳන ලද විනිසුරුවරයන් සමඟ පවත්වන ලද සාකච්ඡා, වින්දිතයින්, ගොදුරුවූවන් හා සාක්ෂිකරුවන් සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡා, වධ හිංසා පැමිණිවීම් පිළිබඳ නඩුවලට පෙනී සිටින ලද නීතිඥයන් සමඟ කරන ලද සාකච්ඡාවලින් ලබා ගන්නා ලද තොරතුරු මෙම පරීක්ෂණයේ දී උපයෝගී කර ගන්නා ලදි. මීට අමතරව මෙම සිද්ධීන්වලදී වරදකරුවන් වූ පුද්ගලයින්, මානව හිමිකම් පිළිබඳ ක්‍රියා කරන රාජ්‍ය නොවන සංවිධානවල නිළධාරින් සමඟ සිදු කරනු ලැබූ සම්මුඛ සාකච්ඡාවලින් ද තොරතුරු රැස් කරගන්නා ලදි. මෙම තොරතුරු සියල්ලම ක්ෂේත්‍ර මූලාශ්‍ර තුලින් ලබා ගන්නා ලද තොරතුරු වේ.

## 1:5 දත්ත රැස් කිරීමේ ක්‍රම

පර්යේෂණයේ දත්ත රැස් කර ගැනීමේ ප්‍රධාන ක්‍රම වේදයන් ලෙස සම්මුඛ සාකච්ඡා භාවිත කරන ලදි. මෙම සම්මුඛ සාකච්ඡා සියල්ලම සැලසුම් කරන ලද ප්‍රශ්ණාවලියක් මත සිදු නොකරන ලදී.මෙහිදී සම්මුඛ සාකච්ඡා වලට සහභාගී වූ අයගෙන් තොරතුරු රැස් කර ගැනීමට අදාල වන ආකාරයෙන් සාකච්ඡා පවත්වන ලදි. මෙම සම්මුඛ සාකච්ඡා වින්දිතයින්, සැකකරුවන්, නීතිඥයින් , විනිසුරුවරුන් ,පොලිස් නිලධාරින් සමඟ සිදු කිරීම මගින් ඉතා වැදගත් තොරතුරු රාශියක් රැස් කර ගැනීමට හැකියාව ලැබුණි.

මෙම පර්යේෂණය සඳහා නියැදි තෝරා ගැනීමේදි හා අධ්‍යයන ප්‍රදේශය තෝරා ගැනීමේදි ලංකාවේ සෑම නියෝජ්‍ය පොලිස්පති දිසාවන් ආවරණය වන සේ තෝරා ගන්නා ලද පොලිස් ස්ථාන 25 කින් නිලධාරින් 50 දෙනෙකුගෙන් යුක්ත වු නියැදියක් ලබාගෙන එම නියැදිය මගින් තොරතුරු ලබා ගන්නා ලදි.